# විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව

## පුරප්පාඩු

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව (UGC) විසින් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා ලේකම් කාර්යාලයේ පහත සඳහන් තනතුරු තුන (3) සඳහා අදාල පරිදි සුදුසුකම්ලත් අපේක්ෂකයින්ගෙන් අයදුම්පත් සලකා බලනු ලැබේ;

1. අතිරේක ලේකම් තනතුර
2. ගණකාධිකාරි තනතුර
3. අභ්‍යන්තර විගණක තනතුර

### 1. අතිරේක ලේකම් තනතුර

**සුදුසුකම්:**

(අ) පිළිගත් විශ්වවිද්‍යාලයකින් / උසස් අධ්‍යාපන ආයතනයකින් ලබා ගත් පළමු හෝ දෙවන පන්තියේ උපාධියක් සහ පරිපාලනය හෝ කළමනාකරණය පිළිබඳ ආචාර්ය උපාධියක් ලබා තිබිය යුතු අතර ප්‍රථම උපාධිය ලබා ගැනීමෙන් අනතුරුව අවම වශයෙන් වසර දහයක (10) පරිපාලනමය පළපුරුද්ද අවශ්‍ය වේ.

**හෝ**

(ආ) පිළිගත් විශ්වවිද්‍යාලයකින් / උසස් අධ්‍යාපන ආයතනයකින් ලබා ගත් පළමු හෝ දෙවන පන්තියේ උපාධියක් සහ පරිපාලනය හෝ කළමනාකරණය පිළිබඳ අවම වශයෙන් වසර දෙක (02) ක පශ්චාත් උපාධියක් ලබා තිබිය යුතු අතර ප්‍රථම උපාධිය ලබා ගැනීමෙන් අනතුරුව වසර දොළහ (12) ට නොඅඩු පරිපාලනමය පළපුරුද්ද අවශ්‍ය වේ.

**හෝ**

(ඇ) පිළිගත් විශ්වවිද්‍යාලයකින් / උසස් අධ්‍යාපන ආයතනයකින් ලබා ගත් උපාධියක් සහ පරිපාලනය හෝ කළමනාකරණය පිළිබඳ වසරකට (01) නොඅඩු පශ්චාත් උපාධියක් සහිත කොමිෂන් සභාවේ / උසස් අධ්‍යාපන ආයතනයක/ආයතනයක නියෝජ්‍ය ලේකම් / නියෝජ්‍ය ලේඛකාධිකාරී තනතුරක් දරන්නෙකු වීම හා එකී තනතුරේ වසර තුන (03) ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර, *ප්‍රථම උපාධිය ලබා ගැනීමෙන් අනතුරුව වසර දහහතර (14) ට නොඅඩු පරිපාලනමය පළපුරුද්ද ලබා තිබිය යුතු* අතර අවම වශයෙන් *ඉන්* වසර පහක් (05) ක් කොමිෂන් සභාවේ / උසස් අධ්‍යාපන ආයතනයක / ආයතනයක නියෝජ්‍ය ලේකම් / නියෝජ්‍ය ලේඛකාධිකාරී සහ / හෝ ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් / ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී මට්ටමේ U-EX 2(1) ශ්‍රේණියේ විය යුතුය.

**හෝ**

(ඇ) පිළිගත් විශ්වවිද්‍යාලයකින් / උසස් අධ්‍යාපන ආයතනයකින් ලබා ගත් උපාධියක් සහ පරිපාලනය හෝ කළමනාකරණය පිළිබඳ වසරකට (01) නොඅඩු පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් සහිත කොමිෂන් සභාවේ / උසස් අධ්‍යාපන ආයතනයක/ ආයතනයක නියෝජ්‍ය ලේකම් / නියෝජ්‍ය ලේඛකාධිකාරී තනතුරක් දරන්නෙකු වීම හා එකී තනතුරේ වසර තුන (03) ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර, ප්‍රථම උපාධිය ලබා ගැනීමෙන් අනතුරුව වසර පහළොව (*15*) කට නොඅඩු පරිපාලනමය පළපුරුද්ද ලබා තිබිය යුතු අතර, අවම වශයෙන් ඉන් වසර පහක් (*05)* ක් කොමිෂන් සභාවේ / උසස් අධ්‍යාපන ආයතනයක / ආයතනයක නියෝජ්‍ය ලේකම් / නියෝජ්‍ය ලේඛකාධිකාරී සහ / හෝ ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් / ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී මට්ටමේ U-EX 2(1) ශ්‍රේණියේ විය යුතුය.

**හෝ**

(ඉ) කොමිෂන් සභාවේ / උසස් අධ්‍යාපන ආයතනයක / ආයතනයක නියෝජ්‍ය ලේකම් / නියෝජ්‍ය ලේඛකාධිකාරී තනතුරක වසර තුනක (03) සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති පිළිගත් විශ්වවිද්‍යාලයකින් / උසස් අධ්‍යාපන ආයතනයකින් උපාධියක් ලබා ගත් නීතිඥවරයෙකු වීම හා ප්‍රථම උපාධිය ලබා ගැනීමෙන් අනතුරුව වසර පහළොවක (15) පරිපාලනමය පළපුරුද්ද ලබා තිබිය යුතු අතර, අවම වශයෙන් ඉන් වසර පහක් (05) ක් කොමිෂන් සභාවේ / උසස් අධ්‍යාපන ආයතනයක / ආයතනයක නියෝජ්‍ය ලේකම් / නියෝජ්‍ය ලේඛකාධිකාරී සහ / හෝ ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් / ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී මට්ටමේ U-EX 2(1) ශ්‍රේණියේ විය යුතුය.

**හෝ**

(ඊ) පිළිගත් විශ්වවිද්‍යාලයකින් / උසස් අධ්‍යාපන ආයතනයකින් උපාධිය ලබා ගත් කොමිෂන් සභාවක / උසස් අධ්‍යාපන ආයතනයක / ආයතනයක වසර දහඅටක (18) පරිපාලනමය පළපුරුද්ද සහිත සහ ඉන් අවම වශයෙන් වසර තුනක් (03) නියෝජ්‍ය ලේකම් / නියෝජ්‍ය ලේඛකාධිකාරී තනතුරේ ස්ථිර කරන ලද කොමිෂන් සභාවේ / උසස් අධ්‍යාපන ආයතනයක / ආයතනයක නියෝජ්‍ය ලේකම් / නියෝජ්‍ය ලේඛකාධිකාරී තනතුරක් දරන්නෙකු වීම.

සටහන:

**"පරිපාලනමය පළපුරුද්ද" යන්නෙන් අදහස් කරනුයේ පිළිගත් විශ්වවිද්‍යාලයකින් / උසස් අධ්‍යාපන ආයතනයකින් ප්‍රථම උපාධිය ලබා ගැනීමෙන් අනතුරුව ශ්‍රී ලංකා පරිපාලන සේවයේ තනතුරක හෝ රාජ්‍ය හෝ පෞද්ගලික අංශයේ 'සංවිධානයක මානව සම්පත් කළමනාකරණය හෝ සාමාන්‍ය පරිපාලනය හෝ සමස්ත කළමනාකරණය පිළිබඳ ඒ සමාන තනතුරක ලබා ඇති පළපුරුද්දයි. මූල්‍ය /ඉංජිනේරු විද්‍යාව හෝ වෙනත් තාක්ෂණික ක්ෂේත්‍ර වැනි විශේෂිත ක්ෂේත්‍රවල ලබා ඇති පළපුරුද්ද මේ සඳහා සලකා බලනු නොලැබේ."**

**වැටුප් පරිමාණය:**

**U–EX 3 (I) – මාසිකව රු. 181,730-3x3,900;11x4,850 -246,780**

(මීට අමතරව, රජය විසින් අනුමත කරන ලද දීමනා ගෙවනු ලැබේ.)

**තෝරා ගැනීමේ නිර්ණායක:**

අ) ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින් තෝරා ගැනීම සිදු කෙරේ.

ආ) සම්මුඛ පරීක්ෂණයේ දී 40% හෝ ඉන් ඉහළ ලකුණු ලබා ගන්නා අයදුම්කරුවන් තෝරා ගනු ලැබීම පිණිස සලකා බැලීම සඳහා සුදුසුකම් ලබයි.

## 2. ගණකාධිකාරි තනතුර

**සුදුසුකම්:**

1.(අ) ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරණ ආයතනයේ (CASL) සාමාජිකත්වය හෝ ඒ හා සමාන සුදුසුකම් ලබා තිබිය යුතුය;

**සහ**

(ආ) ඉහත 1(අ) සුදුසුකම් ලබා ගැනීමෙන් අනතුරුව මූල්‍ය සහ / හෝ විගණනය පිළිබඳ අවම වශයෙන් අවුරුදු හයක (06) විධායක මට්ටමේ පළපුරුද්ද ලබා තිබිය යුතුය.

**හෝ**

2. පහත සඳහන් දෑ සමඟ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ හෝ උසස් අධ්‍යාපන ආයතනයක / ආයතනයක නියෝජ්‍ය ගණකාධිකාරී / නියෝජ්‍ය මූල්‍යාධිකාරී / නියෝජ්‍ය අභ්‍යන්තර විගණක තනතුරක් දරන්නෙකු වීම;

- එම තනතුරේ වසර තුනක (03) සතුටුදායක සේවා කාලයක් සහිතව එම තනතුරේ ස්ථිර කර තිබිය යුතු අතර, ඉන් වසරක් (01) ඉහත 1(අ) සුදුසුකම් ලැබීමෙන් අනතුරුව විය යුතුය.

**හෝ**

3. පහත සඳහන් දෑ සමඟ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ හෝ උසස් අධ්‍යාපන ආයතනයක /ආයතනයක ජ්‍යෙෂ්ඨ සහකාර ගණකාධිකාරී / ජ්‍යෙෂ්ඨ සහකාර මූල්‍යාධිකාරී / ජ්‍යෙෂ්ඨ සහකාර අභ්‍යන්තර විගණක තනතුරක් දරන්නෙකු වීම;

- මූල්‍ය සහ / හෝ විගණනය පිළිබඳ වසර දහයක (10) විධායක මට්ටමේ  පළපුරුද්ද සහිතව එම තනතුරේ ස්ථිර කර තිබීම;
- ඉහත කී වසර දහයෙන් (10)  අවම වශයෙන් අවුරුදු අටක (08) සතුටුදායක සේවා කාලයක් විශ්වවිද්‍යාල පද්ධතියේ ජ්‍යෙෂ්ඨ සහකාර ගණකාධිකාරී / ජ්‍යෙෂ්ඨ සහකාර මූල්‍යාධිකාරී / ජ්‍යෙෂ්ඨ සහකාර අභ්‍යන්තර විගණක තනතුරක් දරා තිබීම;
- ඉහත කී වසර අටක (08) පළපුරුද්දෙන් වසර තුනක් (03)  ඉහත 1(අ) සුදුසුකම් ලැබීමෙන් අනතුරුව විය යුතුය.

**හෝ**

4. පහත සඳහන් සියලු දෑ සමඟ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ හෝ උසස් අධ්‍යාපන ආයතනයක /ආයතනයක නියෝජ්‍ය ගණකාධිකාරී / නියෝජ්‍ය මූල්‍යාධිකාරී / නියෝජ්‍ය අභ්‍යන්තර විගණක තනතුරක් දරන්නෙකු වීම;

- තනතුරෙහි ස්ථිර කර තිබීම;
- ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනයේ (CASL) අන්තර්මධ්‍ය සුදුසුකම හෝ ඒ හා සමාන සුදුසුකමක් ලබා තිබීම;
- පිළිගත් විශ්වවිද්‍යාලයකින් /උසස් අධ්‍යාපන ආයතනයකින් ගණකාධිකරණය / මූල්‍ය / කළමනාකරණය* පිළිබඳ පශ්චාත් උපාධියක් ලබා තිබීම;
- ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනයේ (CASL) අන්තර්මධ්‍යම සුදුසුකම හෝ ඒ හා සමාන සුදුසුකමක් සාර්ථකව සම්පූර්ණ කිරීමෙන් අනතුරුව මූල්‍ය සහ / හෝ විගණනය පිළිබඳව වසර දොළහක (12) විධායක මට්ටමේ පළපුරුද්ද;

- ඉහත පළපුරුද්දෙන් වසර දහයක් (10) විශ්වවිද්‍යාල පද්ධතියේ ජ්‍යෙෂ්ඨ සහකාර ගණකාධිකාරී / ජ්‍යෙෂ්ඨ සහකාර අභ්‍යන්තර විගණක හෝ ජ්‍යෙෂ්ඨ සහකාර මූල්‍යාධිකාරී තනතුරේ සේවය කර තිබිය යුතුය.

**හෝ**

5. පහත සඳහන් සියලු දෑ සමඟ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ /උසස් අධ්‍යාපන අයතනයක/ ආයතනයක නියෝජ්‍ය ගණකාධිකාරී / නියෝජ්‍ය අභ්‍යන්තර විගණක හෝ නියෝජ්‍ය මූල්‍යාධිකාරී තනතුර දරන්නකු වීම:

- එම තනතුරෙහි වසර තුනක (03) සතුටුදායක සේවා කාලයක් තිබීම සහ තනතුරෙහි ස්ථිර කර තිබීම
- පිළිගත් විශ්වවිද්‍යාලයකින් / උසස් අධ්‍යාපන ආයතනයකින් ප්‍රථම උපාධියක් ලබා ගෙන තිබීම;
- ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනයේ (CASL) අන්තර්මධ්‍යම සුදුසුකම හෝ ඒ හා සමාන සුදුසුකමක් ලබා තිබීම

හෝ

- ශ්‍රී ලංකා උසස් තාක්ෂණ ආයතනය (SLIATE) හෝ එහි පූර්වගාමී ආයතනය විසින් පවත්වන ලද ගණකාධිකරණය පිළිබඳ උසස් තාක්ෂණ ඩිප්ලෝමාව ( HNDA);
- ඉහත සඳහන් කරන ලද අන්තර්මධ්‍යම සුදුසුකම / ගණකාධිකරණය පිළිබඳ උසස් තාක්ෂණ ඩිප්ලොමාව (HNDA) ලබා ගැනීමෙන් අනතුරුව මූල්‍ය සහ / හෝ විගණනය පිළිබඳව වසර දහහතරක (14) විධායක මට්ටමේ පළපුරුද්ද;
- ඉහත පළපුරුද්දෙන් අවම වශයෙන් වසර පහක් (05) විශ්වවිද්‍යාල පද්ධතියේ නියෝජ්‍ය ගණකාධිකාරී / නියෝජ්‍ය අභ්‍යන්තර විගණක හෝ නියෝජ්‍ය මූල්‍යාධිකාරී තනතුරක සහ / හෝ U-EX 2(I) වැටුප් කේතය මඟින් දක්වන වැටුප් පරිමාණය දරන ජ්‍යෙෂ්ඨ සහකාර ගණකාධිකාරී / ජ්‍යෙෂ්ඨ සහකාර අභ්‍යන්තර විගණක හෝ ජ්‍යෙෂ්ඨ සහකාර මූල්‍යාධිකාරී තනතුරක විය යුතුය.

**හෝ**

6. පහත සඳහන් සියලු දෑ සමඟ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ /උසස් අධ්‍යාපන අයතනයක/ ආයතනයක නියෝජ්‍ය ගණකාධිකාරී / නියෝජ්‍ය අභ්‍යන්තර විගණක හෝ නියෝජ්‍ය මූල්‍යාධිකාරී තනතුර දරන්නකු වීම;

- එම තනතුරෙහි ස්ථිර කර තිබීම;
- පිළිගත් විශ්වවිද්‍යාලයකින් /උසස් අධ්‍යාපන ආයතනයකින් ලබා ගත් ප්‍රථම උපාධිය

හෝ

- ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනයේ (CASL) අන්තර්මධ්‍යම සුදුසුකම හෝ ඒ හා සමාන සුදුසුකමක් ලබා තිබීම

හෝ

- ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය (SLIATE) හෝ එහි පූර්වගාමී ආයතනය විසින් පවත්වන ලද ගණකාධිකරණය පිළිබඳ උසස් තාක්ෂණ ඩිප්ලොමාව ( HNDA);
- විශ්වවිද්‍යාල පද්ධතියේ මූල්‍ය සහ / හෝ විගණනය පිළිබඳ වසර දහඅටකට ( 18) නොඅඩු පළපුරුද්දක් තිබීම;
- ඉහත පළපුරුද්දෙන් වසර තුනක් (03) විශ්වවිද්‍යාල පද්ධතියේ නියෝජ්‍ය ගණකාධිකාරී / නියෝජ්‍ය අභ්‍යන්තර විගණක හෝ නියෝජ්‍ය මූල්‍යාධිකාරී තනතුරක විය යුතුය.

**හෝ**

7. පහත සඳහන් සියලු දෑ සමඟ ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ ගණකාධිකාරී II ශ්‍රේණියේ තනතුරක් දැරීම;

- ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනයේ (CASL) හෝ ඒ හා සමාන ආයතනයක සාමාජිකත්වය දැරිය යුතුය;

හෝ

- පිළිගත් විශ්වවිද්‍යාලයකින් /උසස් අධ්‍යාපන ආයතනයකින් ගණකාධිකරණය / මූල්‍ය / කළමනාකරණය* පිළිබඳ පශ්චාත් උපාධියක් ලබා තිබීම.

සටහන : **' මූල්‍ය සහ / හෝ විගණන'** පළපුරුද්ද යනු රජයේ හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක මූල්‍ය සහ / හෝ විගණනය සම්බන්ධයෙන් ලබා ගත් විධායක මට්ටමේ පළපුරුද්දයි.

* **'කළමනාකරණය'** යන යෙදුමෙන් අර්ථ දැක්වෙනුයේ ගණකාධිකරණය සහ මූල්‍ය යන ප්‍රධාන සංරචක සමඟ කළමනාකරණය/ රාජ්‍ය පරිපාලනය/ ව්‍යාපාර පරිපාලනය පිළිබඳ උපාධියකි.

**වැටුප් පරිමාණය :**

**U–EX 3 (II) – මාසිකව රු. 166,130-7x3,900;11x4,850 -246,780**

(මීට අමතරව, රජය විසින් අනුමත කරන ලද දීමනා ගෙවිනු ලැබේ.)

**තෝරා ගැනීමේ නිර්ණායක:**

අ) ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින් තෝරා ගැනීම සිදු කෙරේ.

ආ) සම්මුඛ පරීක්ෂණයේ දී 40% හෝ ඉන් ඉහළ ලකුණු ලබා ගන්නා අයදුම්කරුවන් තෝරා ගනු ලැබීම පිණිස සලකා බැලීම සඳහා සුදුසුකම් ලබයි.

## 3. <u>අභ්‍යන්තර විගණක තනතුර</u>

**සුදුසුකම්:**

1.(අ) ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරණ ආයතනයේ (CASL) සාමාජිකත්වය හෝ ඒ හා සමාන සුදුසුකම් ලබා තිබිය යුතුය;

**සහ**

(ආ) ඉහත 1(අ) සුදුසුකම් ලබා ගැනීමෙන් අනතුරුව විධායක මට්ටමකින් මූල්‍ය සහ / හෝ විගණනය පිළිබඳ අවම වශයෙන් අවුරුදු හයක (06) පළපුරුද්දක් ලබා තිබිය යුතුය.

**හෝ**

2. පහත සඳහන් දෑ සමඟ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ හෝ උසස් අධ්‍යාපන ආයතනයක / ආයතනයක නියෝජ්‍ය ගණකාධිකාරී / නියෝජ්‍ය මූල්‍යාධිකාරී / නියෝජ්‍ය අභ්‍යන්තර විගණක තනතුරක් දරන්නෙකු වීම;

- එම තනතුරේ වසර තුනක (03) සතුටුදායක සේවා කාලයක් සහිතව එම තනතුරේ ස්ථිර කර තිබිය යුතු අතර, ඉන් වසරක් (01) ඉහත 1(අ) සුදුසුකම් ලැබීමෙන් අනතුරුව විය යුතුය.

**හෝ**

3. පහත සඳහන් සියලු දෑ සමඟ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ හෝ උසස් අධ්‍යාපන ආයතනයක /ආයතනයක ජ්‍යෙෂ්ඨ සහකාර ගණකාධිකාරී / ජ්‍යෙෂ්ඨ සහකාර මූල්‍යාධිකාරී / ජ්‍යෙෂ්ඨ සහකාර අභ්‍යන්තර විගණක තනතුරක් දරන්නෙකු වීම;

- මූල්‍ය සහ / හෝ විගණනය පිළිබඳ වසර දහයක (10) විධායක මට්ටමේ පළපුරුද්ද සහිතව එම තනතුරේ ස්ථිර කර තිබීම;
- ඉහත කී වසර දහයෙන් (10) අවම වශයෙන් අවුරුදු අටක (08) සතුටුදායක සේවා කාලයක් විශ්වවිද්‍යාල පද්ධතියේ ජ්‍යෙෂ්ඨ සහකාර ගණකාධිකාරී / ජ්‍යෙෂ්ඨ සහකාර මූල්‍යාධිකාරී / ජ්‍යෙෂ්ඨ සහකාර අභ්‍යන්තර විගණක තනතුරක් දරා තිබීම;
- ඉහත කී වසර අටක (08) පළපුරුද්දෙන් වසර තුනක් (03) ඉහත 1(අ) සුදුසුකම් ලැබීමෙන් අනතුරුව විය යුතුය.

**හෝ**

4. පහත සඳහන් සියලු දෑ සමඟ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ හෝ උසස් අධ්‍යාපන ආයතනයක /ආයතනයක නියෝජ්‍ය ගණකාධිකාරී / නියෝජ්‍ය මූල්‍යාධිකාරී / නියෝජ්‍ය අභ්‍යන්තර විගණක තනතුරක් දරන්නෙකු වීම;

- තනතුරෙහි ස්ථිර කර තිබීම;
- ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනයේ (CASL) අන්තර්මධ්‍ය සුදුසුකම හෝ ඒ හා සමාන සුදුසුකමක් ලබා තිබීම.;
- පිළිගත් විශ්වවිද්‍යාලයකින් /උසස් අධ්‍යාපන ආයතනයකින් ගණකාධිකරණය / මූල්‍ය / කළමනාකරණය* පිළිබඳ පශ්චාත් උපාධියක් ලබා තිබීම;
- ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනයේ (CASL) අන්තර්මධ්‍යම සුදුසුකම හෝ ඒ හා සමාන සුදුසුකමක් සාර්ථකව සම්පූර්ණ කිරීමෙන් අනතුරුව මූල්‍ය සහ / හෝ විගණනය පිළිබඳව වසර දොළහක (12) විධායක මට්ටමේ පළපුරුද්ද;
- ඉහත පළපුරුද්දෙන් වසර දහයක් (10) විශ්වවිද්‍යාල පද්ධතියේ ජ්‍යෙෂ්ඨ සහකාර ගණකාධිකාරී / ජ්‍යෙෂ්ඨ සහකාර අභ්‍යන්තර විගණක හෝ ජ්‍යෙෂ්ඨ සහකාර මූල්‍යාධිකාරී තනතුරේ සේවය කර තිබිය යුතුය.

**හෝ**

5. පහත සඳහන් සියලු දෑ සමඟ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ /උසස් අධ්‍යාපන අයතනයක/ ආයතනයක නියෝජ්‍ය ගණකාධිකාරී / නියෝජ්‍ය අභ්‍යන්තර විගණක හෝ නියෝජ්‍ය මූල්‍යාධිකාරී තනතුර දරන්නකු වීම:

- එම තනතුරෙහි වසර තුනක (03) සතුටුදායක සේවා කාලයක් තිබීම සහ තනතුරෙහි ස්ථිර කර තිබීම
- පිළිගත් විශ්වවිද්‍යාලයකින් / උසස් අධ්‍යාපන ආයතනයකින් ප්‍රථම උපාධියක් ලබා ගෙන තිබීම;
- ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනයේ (CASL) අන්තර්මධ්‍යම සුදුසුකම හෝ ඒ හා සමාන සුදුසුකමක් ලබා තිබීම

හෝ

- ශ්‍රී ලංකා උසස් තාක්ෂණ ආයතනය (SLIATE) හෝ එහි පූර්වගාමී ආයතනය විසින් පවත්වන ලද ගණකාධිකරණය පිළිබඳ උසස් තාක්ෂණ ඩිප්ලෝමාව ( HNDA);
- ඉහත සඳහන් කරන ලද අන්තර්මධ්‍යම සුදුසුකම / ගණකාධිකරණය පිළිබඳ උසස් තාක්ෂණ ඩිප්ලෝමාව (HNDA) ලබා ගැනීමෙන් අනතුරුව මූල්‍ය සහ / හෝ විගණනය පිළිබඳව වසර දහහතරක (14) විධායක මට්ටමේ පළපුරුද්ද;

- ඉහත පළපුරුද්දෙන් අවම වශයෙන් වසර පහක් (05) විශ්වවිද්‍යාල පද්ධතියේ නියෝජ්‍ය ගණකාධිකාරී / නියෝජ්‍ය අභ්‍යන්තර විගණක හෝ නියෝජ්‍ය මූල්‍යාධිකාරී තනතුරක සහ / හෝ U-EX 2(I) වැටුප් කේතය මගින් දක්වන වැටුප් පරිමාණය දරන ජ්‍යෙෂ්ඨ සහකාර ගණකාධිකාරී / ජ්‍යෙෂ්ඨ සහකාර අභ්‍යන්තර විගණක හෝ ජ්‍යෙෂ්ඨ සහකාර මූල්‍යාධිකාරී තනතුරක විය යුතුය.

**හෝ**

6. පහත සඳහන් සියලු දෑ සමඟ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ /උසස් අධ්‍යාපන අයතනයක/ ආයතනයක නියෝජ්‍ය ගණකාධිකාරී / නියෝජ්‍ය අභ්‍යන්තර විගණක හෝ නියෝජ්‍ය මූල්‍යාධිකාරී තනතුර දරන්නකු වීම;

- එම තනතුරෙහි ස්ථිර කර තිබීම;
- පිළිගත් විශ්වවිද්‍යාලයකින් /උසස් අධ්‍යාපන ආයතනයකින් ලබා ගත් ප්‍රථම උපාධිය

හෝ

- ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනයේ (CASL) අන්තර්මධ්‍යම සුදුසුකම හෝ ඒ හා සමාන සුදුසුකමක් ලබා තිබීම

හෝ

- ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය (SLIATE) හෝ එහි පූර්වගාමී ආයතනය විසින් පවත්වන ලද ගණකාධිකරණය පිළිබඳ උසස් තාක්ෂණ ඩිප්ලොමාව ( HNDA);
- විශ්වවිද්‍යාල පද්ධතියේ මූල්‍ය සහ / හෝ විගණනය පිළිබඳ වසර දහඅටකට ( 18) නොඅඩු පළපුරුද්දක් තිබීම;
- ඉහත පළපුරුද්දෙන් වසර තුනක් (03) විශ්වවිද්‍යාල පද්ධතියේ නියෝජ්‍ය ගණකාධිකාරී / නියෝජ්‍ය අභ්‍යන්තර විගණක හෝ නියෝජ්‍ය මූල්‍යාධිකාරී තනතුරක විය යුතුය.

**හෝ**

7. පහත සඳහන් සියලු දෑ සමඟ ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ ගණකාධිකාරී II ශ්‍රේණියේ තනතුරක් දැරීම;

- ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනයේ (CASL) හෝ ඒ හා සමාන ආයතනයක සාමාජිකත්වය දැරිය යුතුය;

හෝ

- පිළිගත් විශ්වවිද්‍යාලයකින් /උසස් අධ්‍යාපන ආයතනයකින් ගණකාධිකරණය / මූල්‍ය / කළමනාකරණය* පිළිබඳ පශ්චාත් උපාධියක් ලබා තිබීම.

**සටහන** : '**මූල්‍ය සහ / හෝ විගණන**' පළපුරුද්ද යනු රජයේ හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක මූල්‍ය සහ / හෝ විගණනය සම්බන්ධයෙන් ලබා ගත් විධායක මට්ටමේ පළපුරුද්දයි.

* '**කළමනාකරණය**' යන යෙදුමෙන් අර්ථ දැක්වෙනුයේ ගණකාධිකරණය සහ මූල්‍ය ප්‍රධාන සංරචක සමඟ කළමනාකරණය/ රාජ්‍ය පරිපාලනය/ ව්‍යාපාර පරිපාලනය පිළිබඳ උපාධියකි.

**වැටුප් පරිමාණය :**

**U–EX 3 (II) – මාසිකව රු. 166,130-7x3,900;11x4,850 -246,780**

(මීට අමතරව, රජය විසින් අනුමත කරන ලද දීමනා ගෙවිය යුතුය))

**තෝරා ගැනීමේ නිර්ණායක:**

අ) ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින් තෝරා ගැනීම සිදු කෙරේ.

ආ) සම්මුඛ පරීක්ෂණයේ දී 40% හෝ ඉන් ඉහළ ලකුණු ලබා ගන්නා අයදුම්කරුවන් තෝරා ගනු ලැබීම පිණිස සලකා බැලීම සඳහා සුදුසුකම් ලබයි.

-----------------------------------------------------------------------------------------------------------------------

**<u>තනතුරු තුනටම අදාළ වන සාමාන්‍ය කොන්දේසි:</u>**

**වෙනත් ප්‍රතිලාභ :**

(i). **අර්ථසාධක අරමුදල් සහ දායක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය**

සේවකයා සහ සේවායෝජකයා විසින් වැටුපෙන් පිළිවෙලින් 10% සහ 7% ක් විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදලට බැර කරනු ඇත. තවද, වැටුපෙන් 8% ක් සේවායෝජකයා විසින් විශ්‍රාම වැටුප් අරමුදලට බැර කරනු ඇත.

- *පත්කිරීමේ දින සිට අනිවාර්ය විශ්‍රාම යාමේ වයස (අනධ්‍යයන - අවුරුදු 60) දක්වා විශ්වවිද්‍යාල පද්ධතිය තුළ වසර විස්සක් හෝ ඊට වැඩි කාලයක් සේවය කිරීමට නොහැකි වන සේවකයින් විශ්වවිද්‍යාල විශ්‍රාම වැටුප් අරමුදලට දායක නොවන අතර එවැනි සේවකයෙකු විශ්වවිද්‍යාල විශ්‍රාම වැටුප් අරමුදලේ සාමාජිකයෙකු නොවනු ඇත.*

(ii). **සේවක භාරකාර අරමුදල**

සේවා යෝජකයා විසින් වැටුපෙන් 03%ක මුදලක් බැර කරනු ඇත.

(iii). **පාරිතෝෂිකය**

1983 අංක 12 දරන පාරිතෝෂික ගෙවීම් පනතේ විධිවිධාන ප්‍රකාරව පාරිතෝෂික ගෙවනු ඇත.

* ඉහත තනතුරු දරන්නන් අදාළ රජයේ රෙගුලාසිවලට අනුව නිල ප්‍රවාහන පහසුකම් ලැබීමට හෝ ප්‍රවාහනය වෙනුවට දීමනාවක් ගෙවනු ලැබීමට සුදුසුකම් ලබයි.

* ඉහත තනතුරු දරන්නන් අදාළ විධිවිධානවලට අනුව නියමිත සේවා කාලය සම්පූර්ණ කිරීමෙන් අනතුරුව සම්පූර්ණ වැටුප් සහිත සප්ත වාර්ෂික නිවාඩු සඳහා සුදුසුකම් ලැබේ.

**වෙනත් කොන්දේසි:**

(i) අයදුම්පත් සැකසීමේ ගාස්තුව:

අතිරේක ලේකම්, ගණකාධිකාරී හෝ අභ්‍යන්තර විගණක යන එක් එක් තනතුර සඳහා රු. 1,000/- ක ආපසු නොගෙවනු ලබන අයදුම්පත් සැකසුම් ගාස්තුවක් ගෙවිය යුතුය. මෙම ගෙවීම ලංකා බැංකුවේ ටොරින්ටන් ශාඛාවේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා ගිණුම් අංක 0002323287 වෙත සිදු කළ යුතුය. බැංකු තැන්පතු පත්‍රයෙහි ගනුදෙනුකරුගේ පිටපතෙහි, ඔබගේ නම සහ බැංකු විස්තර සහ අයදුම් කරනු ලබන ''තනතුරේ නම'' යොමුවක් ලෙස සඳහන් කළ යුතුය.

අයදුම්පතෙහි දක්වා ඇති අදාළ කොටුව තුළ බැංකු තැන්පතු පත්‍රය ඇලවිය යුතුය. අයදුම්කරුගේ විස්තර නොමැති බැංකු තැන්පතු පත්‍ර පිළිගනු නොලබන බව කාරුණිකව සලකන්න.

(ii) ඉහත තනතුරු සඳහා අයදුම්පත් නියමිත අයදුම්පත්‍ර ආකෘතිය මගින් ඉදිරිපත් කළ යුතු අතර, එය වි.වි.ප්‍ර.කො. වෙබ් අඩවියේ www.ugc.ac.lk හි "රැකියා අවස්ථා" ("Career Opportunities") සබැඳියෙන් බාගත හැකිය.

(iii) නිසි ලෙස සම්පූර්ණ කරන ලද අයදුම්පත් **අදාළ සියලු සහතිකවල පිටපත් සමඟ <u>2025 දෙසැම්බර් 31 වන දින</u>** වන විට **ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් / පිරිස්, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව, අංක 20, වෝඩ් පෙදෙස, කොළඹ 07** යන ලිපිනයට ලැබෙන පරිදි **<u>ලියාපදිංචි තැපෑලෙන්</u>** යොමු කළ යුතුය. **<u>නියමිත ආකෘති පත්‍රවල</u> එවන ලද අයදුම්පත් පමණක් පිළිගනු ලැබේ**. <u>එක් තනතුරකට වඩා අයදුම් කිරීමට අපේක්ෂා කරන අයදුම්කරුවන් වෙන වෙනම අයදුම්පත් ඉදිරිපත් කළ යුතු අතර, එක් එක් තනතුර සඳහා අයදුම්පත් සැකසුම් ගාස්තුව වෙන වෙනම ගෙවා තිබිය යුතු වේ.</u>

(iv) අයදුම් කරනු ලබන තනතුර කවරයේ ඉහළ වම් කෙළවරේ සඳහන් කළ යුතුය.

(v) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සහ උසස් අධ්‍යාපන ආයතනවල /ආයතනවල, රජයේ දෙපාර්තමේන්තුවල, රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩලවල සේවයේ නියුතු අපේක්ෂකයන් අදාළ ආයතනයේ ප්‍රධානියා හරහා ඔවුන්ගේ අයදුම්පත් ඉදිරිපත් කළ යුතු වේ. අදාළ දෙපාර්තමේන්තු ප්‍රධානීන් හරහා ඉදිරිපත් නොකරන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ඇත.

(vi) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහ උසස් අධ්‍යාපන ආයතන /ආයතන සඳහා වන ආයතන සංග්‍රහයේ අදාළ විධිවිධානවලට අනුව වයස් සීමාව සලකා බලනු ඇත. තවද, සිංහල හා දෙමළ භාෂා දැන්වීම් පාඨවල යම් අනනුකූලතාවයක් ඇති වුවහොත්, එවිට ඉංග්‍රීසි භාෂා දැන්වීම බලපැවැත්විය යුතුය.

(vii) අවසන් දිනට පසුව ලැබෙන අයදුම්පත් /ඉහත අවශ්‍යතා හා අනුකූල නොවන අයදුම්පත් / අසම්පූර්ණ අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ඇත.

(viii) අපේක්ෂකයින් කෙටි ලැයිස්තුගත කිරීමේ අයිතිය විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සතු වේ.

**ලේකම්**
විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව
අංක: 20, වෝඩ් පෙදෙස
කොළඹ – 07

**2025 දෙසැම්බර් 14 වන දින.**